මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව
මුලතිව් දිස්ත්‍රික්කය
---------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දින ද,ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දැක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2016 දෙසැම්බර් 31 දිනට මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදවු කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) පරිත්‍යාග වශෙයන් ලද යන්ත්‍රෝපකරණ 90 ක වටිනාකම පසුගිය වසර 06 ක පුරාම තක්සේකරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් ලද ලී බඩු හා උපකරණ 100 ක වටිනාකම පසුගිය වසර 06 ක් පුරාම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශවලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයතුළදී රු. 122,230ක මිලටගත් ලී බඩු 05 ක් වටිනාකම සමාලෝචිත වර්ෂෙය් මූල්‍ය ප්‍රකාශවලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයතුළදී රු.165,300 ක මිලටගත් වානේ අල්මාරි 14 ක වටිනාකම රු. 49,650 ක් ලෙසට මූල්‍ය ප්‍රකාශනවලට ගැනීම නිසා සමාලෝචිත වර්ෂෙය් මූල්‍ය ප්‍රකාශනවලට ලීබඩු වටිනාකම රු. 115,650 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයතුළදී නිමකළ යුතු එකතුව රු. 9,500,000 ක්වු ප්‍රාග්ධන වැඩ නිමකර නොතිබු අතර, විවිධ ණය හිමියන් යටෙත් ප්‍රතිපාදන සලසා තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) වෙළඳපොළ සාප්පු සංකීරණය සඳහා ලැබිය යුතු එකතුව රු. 172,084 ක් වූ වසර 04 කට අධි කාලයක් තුළ හිඟ හිටීමට ඉඩහැර තිබූ බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්‍රාම ගිය සහ ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් වසර 05 සිට වසර 09ක කාලයක් තුළ හිඟ අයකරගත යුතුව තිබූ එකතුව රු.879,987 ක්වූ හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ගක් ගෙන නොතිබුණි.

1.3.4 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) | |
| (i) පරිච්ඡේදය iii රීති 33 | සමාලෝචිත වර්ෂය තුළදී වරිපනම් තක්සේරු සිදු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි(1) අංක571 | එකතුව රු.2,607,450 ක්වූ විවිධ තැන්පතු වර්ග 05 කට අදාල කේවල තැන්පතු 23 ක් මාස 10 සිට වසර 03 ක කාල පරාසයක් තුළ තැන්පතු ගිණුම් රඳවා තැබීමට ඉඩහැර තිබුණි. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | |
| (i) වගන්ති 5.4.12 | එකතු කළ අගය මත වූ බදු ආවරණය සඳහා ගෙවීම් කිරීමෙන් අනතුරුව, එම ගෙවීම් පිළිබඳ විස්තර පසුව එළඹෙන මාසයේ 15 දින හෝ ඊට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා යවා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු. 31,623,236 ක්වූ අතර පෙර වර්ෂය සඳහා වූ

පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය වූ රු.29,151,362 මුදල හා සැසඳූ විට සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තයේ රු. 2,471,874 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සභාවේ පුනරාවර්තන ප්‍රදාන හා පුනරාවර්තන ආදායම්වල වැඩිවීම් වර්ධනයට ප්‍රධාන හේතුන්වි තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ සභාවේ මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අතිරික්තය වූ රු. 28,912 ක මුදල, ඉකුත් වර්ෂය සඳහා වූ අනුරූපි රු. 165,140 ත ශුද්ධ අතිරික්තය සමඟ සැසඳූවිට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු.136,228ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

2.3. කාරක ප්‍රාග්ධන කළමනාකරණය

--------------------------------------

සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.111,127,345 ක්වූ කාරක ප්‍රාග්ධනය ඉකුත් වර්ෂය සඳහා වූ අනුරූපි කාරක ප්‍රාග්ධනය වූ රු. 99,132,459 ක මුදල හා සැසඳූ විට සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනයේ රු.11,994,886 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් කළමනාකරණය

----------------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------------

ඇස්තමේන්තුගත ආදායම,තත්‍ය ආදායම සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ හිඟ ආදායම සභාව විසින් ඉදිරිපත් කළ පරිදි පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත මුදල | තත්‍ය මුදල | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 452 | 365 | - |
| කුලි හා බදු කුලි | 15,808 | 15,778 | 172 |
| බලපත්‍ර ගාස්තු | 1,296 | 1,461 | - |
| අනෙකුත් ආදායම් | 13,396 | 23,581 | 22,874 |
| එකතුව | 30,952 | 41,185 | 23,049 |

2.4.2 **විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු**

**--------------------------------------**

සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 11 ක් සම්බන්ධයෙන් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, මූලික සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ ආවරණ අනුමැතිය ලබාදීම යන සිව් ආකාරයේ ගාස්තු තක්සේරු කර ගිණුම්වලට ගතයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

සභාවේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 16 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. ඒ නිසා ආදායම් පරීක්ෂාවෙන් හා වෙළඳපොළ අධීක්ෂණයන්ට පැවරුණු කාර්යභාරයන් ඉටු කිරීම, කාර්යාල කාර්යසහායකන්ට ඉඩහැර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංවර්ධන කාර්යයන්ට බලපෑමක් සිදුව තිබුණි.

3.2 අත්හැරදැමු ව්‍යාපෘති

-----------------------

පිරිවැය එකතුව රු. 40,750,000 ක් වශයෙන් ඇස්තමේන්තුගත ප්‍රාග්ධන ව්‍යාපෘති 11 ක් සමාලෝචිත වර්ෂය තුළදී අත්හැර දමා තිබුණි. ප්‍රාග්ධන ව්‍යාපෘති අත්හැරීමට තුඩුදුන් කරුණු විගණනයට ලබා නොදුනි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභා බල ප්‍රදේශයේ ඉවත්කරන කැළි කසල පිලිස්සීම හා පස්වලින් යටකිරීම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් අනුගමනය කර තිබු අතර සභාව විසින් ර කොම්පෝස් හා ප්‍රතිචක්‍රීය වැඩසටහන ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

4.1 ඵලදායී යන්ත්‍රණයක් වශයෙන් යොදාගැනීම් වස් අයවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත වියදම් විෂයයන් 08 ක වියදම හා තත්‍ය වියදම අතර රු. 1,000 සිට රු. 11, 167,293 දක්වා වු පරාසයක විචලනයන් නිරීක්ෂණය විය.

4.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

-----------------------------------------------

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්ඒ/2009(1) හා 2009 ජුනි 09 දිනැති චක්‍රලේඛයට අනුව අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(i) අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම
(ii) ආදායම් රැස්කිරීම.
(iii) ස්ථාවර වත්කම්
(iv) ගිණුම්කරණය
(v) කාර්ය මණ්ඩලය
(vi) පරිත්‍යාග
(vii) මිශ්‍ර තැන්පතු
(viii) අයවැය පාලනය
(ix) ප්‍රසම්පාදන ක්‍රියාවලිය